
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D
*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# සැබෑ සිංහල අවුරුද්දක් !

සිංහළ අළුත් අවුරුද්ද භුක්ති විඳින්නට පිට රට සිටින බොහෝ දෙනා ශ්‍රීලංකාව බලා යන්නට පටන් ගත්තේ මේ මාසය මුල සිටම ය. ඊයේද මා දන්නා හිතවත් පවුල් දෙකක්ම සිය දරුවනුත් කැටිව ලංකාවට ගියේ මෙහි උපත ලැබූ ඒ දරුවන් සිංහළ අවුරුද්දක් දැක නොතිබුණු නිසා ය. මේ වර සිංහළ අවුරුද්දේ විශේෂත්වයක් ඇතියි බොහෝදෙනා දරන සිතුවිල්ල මට ද ඇත. ඊට මූලික හේතුව ශ්‍රීලංකාවට මහා පිළිලයක්ව පැවති කෙළවරක් නොදකින තරමට උද්ගතව තිබූ කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමය. පරාජයවුනා යයි කියනවාට වඩා පරාජය කළායයි කීම වඩා යෝග්‍ය ය. මක්නිසාද එය නිකම්ම සිදුවූ දෙයක් නොව අතිමහත් උත්සාහයක් දරා කරන ලද වැනසීමක් නිසා ය.

ත්‍රස්තවාදයට ලංකා ජනතාව මුහුණ දුන් ආකාරය පහුගිය කාලපරිච්ඡේදයේ පිට රට ජීවත් වූ ලාංකිකයෝ හරිහැටි නොදනිති. හරිහැටි නොදන්නවායයි කීවේ දුකේ පීඩාවේ සැබෑ තත්වය දන්නේ ඊට දෛනිකව මුහුණ දෙමින් ඒ සමාජයේ ජීවත්වූ ගැහැණුන්, මිනිසුන්, දරුවන් විසින් පමණක් බැවිනි. ඒ රටේ බෝම්බයක් පුපුරන්නට කාලයක්, හෝරාවක් හෝ නිශ්චිත තැනක් හෝ අවශ්‍ය වූයේ නැත. කොයි මොහොතක හෝ කොතැනදී හෝ එය සිදුවීමට නියමිතව තිබුණි. ඒ කාලයේ බලයේ සිටි සෑම රජයක්ම ප්‍රශ්නය විසඳන්නේ කෙසේදැයි ප්‍රශ්නය නොයෙක් අත හරවා බලමින් කල්පනා කළෝය. එහෙත් ත්‍රස්තවාදයට කුමන හෝ විසඳුමක් පෙනෙන තෙක් මානයකවත් නොවී ය.

ශ්‍රීලංකාවේ සියළු කටයුතු සිදුවූයේ ත්‍රස්තවාදය පවතින වාතාවරණය තුළ ය. මිනිසුන් පිබිදුණෝ, වැඩට ගියේ, ගමන් බිමන් ගියේ, කෑවේ, බිව්වේ, නින්දට ගියේ ඒ තුළය. දරුවන් පාසැල් ගියේ, කෙළිසෙල්ලම් කළේ ඒ තුළ ය. ක්‍රීඩා, ක්‍රිකට් තරඟ, විවා මංගල්‍ය සහ අන් සියළු උත්සව පැවැත්වූයේ ඒ තුළ ය. සිංහළ අවුරුද්ද, නත්තල හා වෙසක් තිබුණේ ද ඒ තුළය. මෙසේ අවුරුදු 30 කට ආසන්න කාලයක් ශ්‍රීලංකා ජන ජීවිතයේ සෑම අංගයක් ම ඒ කුරිරු දෙමළ කොටි ත්‍රස්තවාදය විසින් ඩැහැගෙන ගිලගනු ලැබ තිබුණේ ය.

රටම ප්‍රීතියෙන් ගත කළයුතු රටේ බහුතර ජනතාවකගේ ජාතික අවුරුද්ද එසේ බියෙන් ඇළලී ගතකරන්නේ නම් එය ප්‍රීති උත්සවයක් වන්නේ කෙසේද? බිය සැක කඳුළ ඇති තැන කුමන ප්‍රීතියක්ද? එකල බොහෝ දෙනා කළේ තමන් අතීතයේ සිංහළ අවුරුද්ද සැමරූ හැටි මෙනෙහි කොට ප්‍රීතිවීම පමණි.

ශ්‍රීලංකාවට සැබෑ නායකත්වයක් පහළවිය. ඉන් දිරිය ලැබූ සන්නද්ධ හමුදාවෝ සතුරන් නසන ක්‍රියාදාමය අකුරටම ඉටුකළෝය. නසන්නට නොහැකියයි මුළු ලොවම එක හෙළා කී ත්‍රස්තවාදය ලොවටම පෙනෙන්නට වේ හුඹහක් පොඩිකරන පහසුවෙන් ඉතා වේගයෙන් ලංකා හමුදාවෝ විනාස කළහ. ඈත අතීතයේ බියෙන් සැකෙන් තොරව ලංකාවාසීන් සිංහළ අවුරුද්ද සැමරුවේ යම්සේ ද මෙවර අවුරුදු 30 කට පසු අප ජනතාව හිතේ බිඳකුදු බියක් සැකක් නැතිව සිංහළ අවුරුදු චාරිත්‍ර ඉටු කරති. මේ ආවේ සැබෑ සිංහළ අවුරුද්දයි. ජයවේවා!

# සිංහල අවුරුදු අසිරිය

♦ අනඳපිය කුඩාතිහි විසිනි



පලබර බක්මාසේ යයි ගැමි වැඩිහිටියන් කියන්නේ සිංහල අවුරුදු සමය එළැඹෙන අප්‍රියෙල් මාසය පලතුරු වර්ග බහුලව වැවෙන සරුසාර මාසයක් බැවිනි.

මෙම ජාතික උලළෙට නැකැත් සතරද සම්බන්ධ යැ. මේෂ රාශිගත වූ හිරු යළිත් ජන්ම රාශිය බලා එන්නේ මේ උත්සව සමයේදී යැයි නැකැත් ඇදුරෝ කියති. හිරු මංගල්‍යය හෙවත් සූර්ය මංගල්‍යය යයි ද මේ උළෙල නමක් දරා ඇත. මේ සමයේදී පවුලේ අයට පමණක් නොව නෑයන්ට හා අසල්වැසියන්ටද බතින් බුලතින් සංග්‍රහකිරීමට සිංහලයෝ සැදී පැහැදී සිටිති. ගෙහිමි කතුන් අහර පිසිනු පිණිස අළුත් වළං මිලදී ගැනීමද මේ මාසයේ මුලදී කරනු දැකිය හැකියි. නව වස්තර සැපයීමට නව මෝස්තර සොයන ගැමි තරුණියෝ ඒ සඳහා වෙහෙසෙති.

රබානට අවුරුදු සමයේ වෙසෙසි තැනක් හිමිවෙයි. අවුරුදු දිනවල රබන් හඬට නටන තරුණ තරුණියන් ගම්වල දැකිය හැකිය. ඔන්චිල්ලාවද බක්මහ උලෙළ සමයේදී යළි පණ ලබයි. තම දූනට සහ පුතුනට සිත්සේ පදින්නට ඔන්චිල්ලා බැඳදීම මේ සමයේ දැක්ක හැකිය. ජාතික ක්‍රීඩාවලට ඉහළ තැනක් මේ දිනවල හිමිවෙයි. කුඩාවුන් කුඩා ඔන්චිලිවල නැගී සින්දු කියමින් නැළැවෙද්දී තරුණියන් දෙදෙනා බැගින් එක ඔන්චිල්ලාවක නැගී වාරම් කියමින් නරඹන්නවුන් කුල්මත් කරන සැටිද මේ සමයේ සුලබ දසුනෙකි.

නිවසේ සාලයේ පංචි දැමීම, චක්ගුඩු පැනීම, කඹ ඇදීම, කොට්ටා පොර, කළගෙඩි බිඳීම, ගෝනියක බැස දිවීම එදා සිට අද දක්වා පවතින අවුරුදු ක්‍රීඩා ය. මා ඉපදී හැදුණු වැඩුණු ගාල්ලේ උණවටුන, යටගල ගම්වල බාල මහලු කවුරුත් මේ ක්‍රීඩාවල නිරතව අවුරුදු උදාව සැමරීම ඉමහත් සොම්නසින් කළහ.

වැඩිහිටි නෑයනට සහ තම දූ පුතුනට නව රෙදි පිළි තෑගිදීම මේ සමයේ බහුලව සිදු කැරෙයි. කුඩා ළමයි එහිදී ඉමහත් සතුටක් විඳිති. අවුරුදු දා නොනගතය පවතින කාලයේදී ගමේ පන්සලට ගොස් මල් පහන් පුදා තමනටත් අනුනටත් සෙත් පැතීම නොවරදවා මැ සිදුවෙයි.

කදමලු ගෙනයාම නම් නම් දැරු චාරිත්‍රය තම තමන්ගේ සවි පමණින් ඉටුකිරීම අවුරුදු දිනවල සිදුවෙයි.

අම්මා හෝ ආත්තම්මා විසින් බදින ලද කැවුමක් කොකිසක් කන්නට කුඩා දරු දැරියෝ පුල පුලා බලා සිටිති. අග්ගලා මුං කැවුම් වැනි රස කැවිලි හැම නිවසෙක මැ පිළියෙළ වෙයි.

මේ උත්සව සමයේ නොකඩවා සිදුවන අගනා කාර්යයෙකි හිරු දෙවියන් නැමැදීම. පැරුණියෝ එම සිරිත රකිමින් භව භෝග සම්පතින් පිරුණු පින්වත් පිරිසගේ ඇසුර ලැබූ ඔවුන්ගේ ස්පර්ශයෙන් ඔදවත් වූ ලක්බිමට සතුට සමාදානය උදාවේවායි ආදිතමයෝ හිරු දෙවි පිහිට පැතූහ. සියවස් ගණනෙක සිට පවතින මෙවැනි සත් සිරිත් සිංහල ජාතියට අඩම්බරයෙකි.

මුළු ලොවමැ සූර්ය දෙවිඳුන්ගේ ජීවය ලබන බව නොරහසකි.

මෙම ජාතික උත්සවය සැබෑ මුහුණුවරින් මැ සැමැරීම කවුරුන්ගේත් යුතුකම යැ. මෙය හෙළ හැදියාවට සිරිතට විරිතට හෙළ කලාවනට අනුරූප ලෙසමපැවැත්වීම අත්‍යවශ්‍යය. රූප සුන්දරී තරඟ ආදිය බාහිර ඔපයට ගැලපුණත් ඒවා බටහිර පන්නයට පැවැත්වීම නුසුදුසුය. වාණිජ රැල්ලට අපේ සාරධර්ම යට නොකළ යුතු මැ යි.

කැවිලි වර්ගයක් විදේශික පන්නයට අයත් වන්නේ නම් ඒවා පිළිකෙව් කැර, අලුවා, දෝසි, කළු දොදොල් වැනි හෙළ කැවිලි වර්ග මැ අවුරුදු කෑමේදී භාවිතා කළ මනායැ. කැකුළු සහලින්මැ කිරිබත් ඉවීමට ගැමි ළඳුන් අතීතයේ සිටමැ පුරුදුව සිටි බව අපි දනිමු. නගර බද බොජුන් හල්වලැ විකිණීමට තිබෙන කට්ලට්ස්, පැටිස්, රෝල්ස් ආදියට නගරබද තරුණ පිරිස ඇබ්බැහි වී සිටීම කනගාටුවට කරුණකි. මේ හෙළ දිව කතුනට පහසුවෙන් මැ පිසිය හැකි රස කැවිලි කොන් කැර විදෙස් ආරේ කැවිලි පෙවිලි භාවිතය පැතිරුණහොත් සිංහල කෑම මේසය කොතෙක් කල් පවතීද?

ඔදවත් තෙදවත් සුලලිත මිහිරි හඬින් යුත් අපගේ මව්බස වන සිංහලය අමතක කැර ඉංග්‍රීසි වදන් හාමුකළ බස් වහරක් වත්මන් තරුණ පරපුරේ වැඩිදෙනෙකු භාවිතා කරනු අසන්නට ලැබේ. එ කලැ තරුණ පරපුර කතාකළ අම්මා, තාත්තා, නැන්දා, මාමා, සීයා, ආත්තම්මා යන වදන් මදර්, ෆාදර්, ග්‍රෑන්ඩ් ෆාදර්, ග්‍රෑන්ඩ් මා, ඈන්ටි, අන්කල් යන පර වදන් හාමු කළ බසක් වත්මන් තරුණ පරපුරේ වැඩි දෙනෙක් භාවිතා කරති.

ඉංගිරිසිය ලෝ පතළ වියත් හර වත් යෙදුම් ඇති බසක් බව කවුරුත් පිළිගනිති. එහෙත් සංකර බස් වහරක් අප තරුණ පෙළ භාවිතා කිරීම ජාතියේ පැවැත්මට මහත් හානියකි.

බස රැස දෙස තෙරුවනකැයි සිය බස පණගැන්වූ එයින්මැ ජාතිය අවදි කළ කුමාරතුංග මුනිදාස පඬිවරයාණෝ නිරතුරුවමැ පැවැසූහ. තමන්ගේ බසට තම මවට මෙන්මැ හරසර දැක්විය යුතු නමුත් එසේ සිදු නොවන බව පෙනෙයි.

සිංහල අවුරුද්ද ගැන ජයන්ත වීරසේ කර පඬිවරයාණන් විසින් පබඳ කරනු ලැබ, සංගීත වෙසරද සුනිල් සාන්තයන් විසින් ගයනු ලැබූ මේ ගීය සිංහල අවුරුද්ද ගැන දෙන පණිවුඩය කොතරම් අර්ථවත්ද?

සිංහල අවුරුද්දේ - මංගල ගී සද්දේ
සිංහල අවුරුද්දේ - උන්සිලි හැම පැද්දේ
සිංහලයන්ගේ ජාතික උලෙළයි මේ
සිංහල සුසිරිත් රැකෙනවැ දින මේ
සිංහල සෙල්ලම් හැම ගමැ රටැ පැතිරේ
සිංහල රසවත් කැවිලි පෙවිලි ගෙදොරේ
කැවුම් කොකිස් අලුවා -
අතිරස මුං කැරලී
කිරිබත් කිරිදෝසී -
මේ ඈ රස කැවිලී
ගෙයක් ගෙයක් පාසා -
ඉදෙයි පිසෙයි මේදිනේ

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

**උත්පලාසය්‍යාරවින්දසය - මත්ස්‍යසය කුමුදස්‍ය ච**
**එකයෝනි ප්‍රසූතානං - තෙෂාං ගන්ධා: පෘථක් පෘථක්**

***අර්ථය*** : *උත්පල, පද්ම, කුමුද සහ මත්ස්‍ය යන මොවුන්ගේ උත්පත්ති ස්ථානය එකම ජලය වුවත් සුවඳ එකිනෙකට වෙනස්ය.*

එකම සමාජයේ එකිනෙකට වෙනස් වූ හොඳ නරක වශයෙන් දෙකොටසකට අයිති පුද්ගලයන් ඇති බව මෙම පද්‍යයෙන් දක්වා ඇත. සමාජය කෙසේ වුවත් පවුල් ඒකකය ගෙන බැලුවද එකම පවුල තුළද විවිධ පුද්ගලයින් සිටින බව පැහැදිලිය. එකම දෙමව්පියන්ගේ දරුවන් පස්දෙනා අතේ ඇඟිලි පහ මෙන් අසමාන බව සමාජයේ පවතින කියමනකි. එකම පවුලේ දෙදෙනෙකුගේ වුවද පැවැතුම් ගති සිරිත් එකිනෙකට වෙනසය. එසේ බලන විට අනෙක් සමාජ තල ගැන කවර කතාද?

එකම පාසැලක, ගුරුවරයෙකුගේ, එකම පන්තියේ සිසුන් දිහා බැලුවත්, එකම කන්තෝරුවක වැඩකරන අය දෙස බැලුවත් ඔවුන්ගේ සිතුම් පැතුම් විවිධය. මෙසේ හැම දෙනාම හොඳ නරක වශයෙන් දෙකොටසකට බෙදිය හැකිය. ඊට අමතරව හොඳ අය වුවද ඒකාකාර වූවන් නොවේ. ඔවුන්ගේ සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් එකිනෙකාට වෙනස්ය. නරක ලෙස හඳුන්වන අය අතරද විවිධ වෙනස්කම් දැකිය හැකිය.

නානත්ත කායා, නානත්ත සඤ්ඤා වශයෙන් බුදුදහමේ හඳුන්වන්නේද මෙම අදහසමය. පුද්ගලයාගෙන් පුද්ගලයාට කායික වශයෙන් මෙන්ම සිතුම් පැතුම් වශයෙන්ද එකිනෙකාට සමාන නොවන බව ඉන් අදහස් කෙරේ. සාමාන්‍ය ව්‍යවහාරයේ භින්න රුචික ලෝකය යනුවෙන් සඳහන් කරන්නේද එයයි. ලෝකය රුචිකත්වය අතින් භින්නය. එනම් විවිධය.

සැමදා එකට එක ගෙදර ජීවත්වන අඹු සැමියන්ද අදහස් අතින් එකිනෙකාට බොහෝ වෙනස්ය. ඇතැම් විට අවුරුදු ගණන් ආදරය කොට පොරොන්දම් බලා මිලියන ගණන් වියදම් කොට කරන මංගල්‍යයන් ඇතැම් විට වසරකටත් වඩා අඩු කාලයකදී නිමාවීම කණගාටුවට කරුණකි.


බොහෝ දුරට සමාජයේ පවතින ගැටුම්වලට ප්‍රධානම හේතුව මෙම එකිනෙකාට වෙනස් සිතුම් පැතුම් ය. භාර්යාවගේ අදහස් වලට විරුද්ධවන ස්වාමිපුරුෂයාටත්, පුරුෂයාගේ අදහස්වලට විරුද්ධවන භාර්යාවටත් එකට ජීවත්වීම අසීරුය. ජීවත් වුවද සැමදාම ගැටුම් හා සිත් වේදනාවන්ගෙන් ජීවත් වීමට සිදුවේ. මෙහිදී කළයුතු වන්නේ දෙදෙනා ඔවු නොවුන්ගේ සිතුම් පැතුම් හඳුනාගෙන ඊට අනුකූලව කටයුතු කිරීමයි.

එකම මවකගේ දරුවන් දෙදෙනෙකුගේ පැවැත්මේ රටාවද මේ සඳහා නිදසුනක් ලෙස ගතහැකිය. කිසි දිනක තම දෙමාපියන්ට හා ගුරුවර ආදීන්ට අකීකරු නොවන යහපත් දරුවා සමාජයට වැඩදායක ගුණගරුක කෙනෙකු වන අතර, අනෙකා දෙමාපිය ගුරුවරාදීන්ට ඇහුම්කන් නොදෙන, අකීකරු, සමාජයට විපත්තිදායක, සමාජ විරෝධී ක්‍රියාකාරකම්හි යෙදෙන, බිහිසුණු අපරාධවලට වගකිවයුතු, දුරාචාරයේ යෙදෙන්නෙකු විය හැකිය.

එසේම එකම රටක ජීවත්වන දෙදෙනෙකු දිහා බැලුවද මේ බව අවබෝධකරගත හැකිය. කෙනෙකු තම රට ජාතිය ආගම කෙරෙහි ආදරය දක්වමින් ඒවා ආරක්ෂාකිරීමට දිවි හිමියෙන් කටයුතු කරන අතර, තවත් අය රට ජාතිය සතුරන්ට පාවා දෙන දේශද්‍රෝහීන් වශයෙන්ද හැඳින්විය හැකිය.

ඒ අනුව මානසික ක්‍රියාකාරිත්වය හා බාහිර අංගෝපාංගයන්ගේ ඇති මෙම විවිධත්වයට හේතු එකක් නොව බොහෝය. එකිනෙකා කරන හොඳ නරකවල ප්‍රතිවිපාක, භෞතික පරිසරයේ බලපෑම, ජීවත්වන සමාජයේ තරාතිරම ආදී නොයෙක් දෑ මීට හේතුවිය හැකිය.

පද්‍යයේ සඳහන් ආකාරයට නෙළුම්, මානෙල්, කුමුදු හා මාළුවන්ට ජලය උත්පත්ති කාරණය වුවද එකිනෙකෙහි හැඩය හා සුවඳද එකිනෙකට මුළුමනින් වෙනස් ය.



♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති
**පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි**
ලන්ඩන් බෞද්ධ විහාරය
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

*Colombo Office*
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632